ආඛ්‍යාන narrations
**Volume 01 | Issue 01 | January – June 2016 | Article 05**
**ISBN 2478-0642**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

ISSN 2478-0642
9 772478 064006

**Recommended Citation**
ගලගමගේ, ප්‍රභාත් (2016) "කුවේණියගේ දරුවන්ගේ දරුවෝ: වැදි ජන නායකයින් විසින් මහාවංශ ආඛ්‍යානයන් බැහැර කිරීම ප්‍රතිරෝධී අනන්‍යතාවක් ලෙස," *ආඛ්‍යාන:* : Vol. 01: Iss. 1, Article 05.
Available at: www.sab.ac.lk

**පර්යේෂණ පත්‍රිකා**

# කුවේණියගේ දරුවන්ගේ දරුවෝ
## වැදි ජන නායකයින් විසින් මහාවංශ ආඛ්‍යානයන් බැහැර කිරීම ප්‍රතිරෝධී අනන්‍යතාවක් ලෙස

ප්‍රභාත් ගලගමගේ



Photo credit: http://www.bbc.com/sinhala/sri_lanka/2016/03/160306_senehe_vaddah_culture_change

# කුවේණියගේ දරුවන්ගේ දරුවෝ
## වැදි ජන නායකයින් විසින් මහාවංශ ආඛ්‍යානයන් බැහැර කිරීම ප්‍රතිරෝධී අනන්‍යතාවක් ලෙස

ප්‍රභාත් ගලගමගේ
B.A(sp), M.A, M.Phil
gprabath@gmail.com

**ප්‍රවේශය**

වැදි ජනයා පැවතෙනුයේ කුවේණියගේ දරුවන්ගෙන්ය යන්න මහාවංශය ඔස්සේ ගලා එන වැදි ජනයාගේ පොදු සම්භවය පිළිබඳ ප්‍රමුඛ ආඛ්‍යානයයි. එහෙත් වැදි ජනයාගේ නායකයින් හා ඔවුන්ගේ මතවාදයන්ගේ ආභාෂය ලත් වැදි ජනයා විසින් මෙම ආඛ්‍යානය ප්‍රතික්ෂේප කරයි. ඔවුන් සඳහන් කරන්නේ වැදි ජනයාගේ සම්භවය එයට වඩා බොහෝ දුරාතීතයට ගමන් කරන බවයි. පොදු සම්භවය පිළිබඳ අධිපති සංස්කෘතිය විසින් නිර්ණය කරන ලද ප්‍රවාදයන් ආදිවාසී ජනයා විසින් බැහැර කිරීම සඳහා පසුබිම සැකසෙන්නේ වර්තමානයේ සිදුකර ඇති පුරාවිද්‍යාත්මක ගවේෂණ ප්‍රමුඛ කොටගත් ලංකා ඉතිහාසය පිළිබඳ නව අනාවරණයන් හා සමගාමීවය. කෙසේ වෙතත් ජනවාර්ගික හෝ සාමූහික අනන්‍යතාවන් හඳුනා ගැනීමේදී වැදගත් වන ප්‍රධාන මානයක් වන පොදු සම්භවය පිළිබඳ ආඛ්‍යානයන් ප්‍රතිනිර්මාණය වන / ප්‍රතිසංස්කරණය වන හා “අනෙකා” විසින් ගොඩනගන ලද තමන් පිළිබඳව වන ආඛ්‍යානයන් බැහැර කරලන මෙම අවස්ථාව වැදි ජනයාගේ ජනවාර්ගික හැඩතලයන්ගේ අනාගතය පිළිබඳව සිදුකරන ගවේෂණයකදී ඉතා වැදගත් වෙයි. මේ අනුව මෙම පත්‍රිකාව තුළින් ඉදිරිපත් කරන්නේ දර්ශනපති උපාධි පර්යේෂණ ව්‍යාපෘතියක අනු කොටසක් ලෙස අධ්‍යයනයට ලක්වූ ක්ෂේත්‍රයකි.

මෙය දඹාන, හෙන්නානිගල හා රතුගල යන ආදිවාසී ජනපද ආශ්‍රිතව සිදුකර ඇති සහභාගිත්ව නිරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡාවන් ප්‍රධාන ලෙස දත්ත රාශිකරණ ක්‍රමවේදයන් ලෙස යොදගෙන ඇති පර්යේෂණයක් වේ.

අධ්‍යයනය ඔස්සේ පැමිණිය හැකිවන නිගමනය වන්නේ වැදි ජන නායකයින් විසින් සිය සම්භවය පිළිබඳ මහාවංශ ආඛ්‍යානය ප්‍රතික්ෂේප කිරීම ප්‍රතිරෝධී අනන්‍යතාවක් ලෙස හැඳිනගත හැකි බවයි. එසේම එය තවදුරටත් විස්තාරණය කළහොත් “ආදිවාසී දේශපාලනයක” හැඩතලද ඒ තුළ හැඳිනගත හැක. මෙම සංසිද්ධිය ආදිවාසී ජනයා ගේ ජනවාර්ගික පැවැත්මේ පරිවර්තනයන් පිළිබඳව සිදුකරන අධ්‍යයනයක දී එහි ගමන්මග පිළිබඳ නිගමනය සඳහා ද ආලෝකයක් සම්පාදනය කරනු ඇත.

**හැඳින්වීම**

වැදි ජනයා නියෝජනය කරනුයේ ජනවාර්ගික අනන්‍යතාවක්ද, එසේත් නැතිනම් වෙනත් ප්‍රජා අනන්‍යතාවක්ද යන්න එතරම් පැහැදිලි නැත. මන්ද වැදි බව හා සිංහල බව අතර ඒකාබද්ධතාවක්ද, විභේදනයක්ද එකවිට ක්‍රියාත්මක වන බැවිණි (මේ පිළිබඳ වැඩිදුර සාකච්ඡාවක් ඉදිරි පෙළ තුළ සටහන් කොට ඇත). ජනවාර්ගික අනන්‍යතාවක් හඳුනා ගත හැකි එක් වැදගත් අංගයක් වන පොදු ඇරඹුම පිළිබඳව, එසේත් නැතහොත් පොදු මුතුන් මිත්තන් පිළිබඳ ආඛ්‍යානයන්ද ස්ථාපිත වන්නේ ජන කොටස් දෙක අතර සහසම්බන්ධතාවක් හා වෙන්කිරීමක්ද එකවිට ගොඩනගමිනි. මේ අනුව මහාවංශය දක්වනු ලබන්නේ විජය රජු හා කුවේණියට දාව උපන් දරු දෙදෙනාගෙන් වැදි ජනයා සම්භවය වූ බවයි. මහාවංශය සිංහල ඇස ඔස්සේ ලියැවුණු ඓතිහාසික ග්‍රන්ථයක් බවද මෙහිදී මතකයට නගා ගත යුතු වෙයි. මේ අනුව සිහල ජනවර්ගය විජයාවතරණ පුරාවෘත්තය හා බැඳෙන විට වැදි ජනයා එකී පුරා වෘත්තයේ කොටසක් වන විජය-කුවේණි සහසම්බන්ධයේ ප්‍රතිපලයක් ලෙස ස්ථාපිත කරයි. ඒසේම සිංහල බව හා වැදි බව අතර ස්ථරායන පරතරයක්ද නිර්මාණය කරයි. වර්ථමාන වැදි ජන නායකයින් මෙම ආඛ්‍යානය ප්‍රතික්ෂේප කරනු දැකගත හැක. එසේම සාමාන්‍ය වැදි ප්‍රජාවගෙන් සැලකිය යුතු පිරිසක්ද මෙම ආඛ්‍යානය බැහැර කරමින් අදහස් දක්වනු දැකිය හැක. මෙය වැදි ජනයාගේ ජනවාර්ගිකත්වය හෝ ඒ හා සමාන අනන්‍යතාවක හැඩගැස්ම පිළිබඳ එක්තරා සංඥවකි. මන්ද මහා සමාජයේ ජනප්‍රිය අදහස වන්නේ දැන් ”වැද්දන් නොමැති බවත්”‍ ඔවුන් කරනුයේ ”වෘත්තියක්” ලෙස වැද්දන් ලෙස පෙනී සිටීම බවත්ය. මෙම අදහසද නැවත වැද්දන් පිළිබඳ අධිපති සංජානනය හා බැඳී ඇත. එය නම් වැද්දන් යනු කොල අතු හැදගත් හෝ රෙදිකඩකින් සැරසුණු, අපිළිවෙළට පවතින දිගු හිසකෙස් සහිත, දඩයමින් දිවි ගෙවනු ලබන, පසුගාමී ප්‍රජාවක් බව හෝ එසේ සිටිය යුතු ප්‍රජාවක් බවයි. නමුත් මෙහි පවතින විරෝධාභාසය වන්නේ වැදි ජනයා සිය, වන පාරිසරිකයෙන් අධිපති සමාජය විසින්ම වියෝකරනු ලැබ තිබීමයි. මිනිසුන්ගේ ජනවාර්ගික හෝ ඒ හා සමාන හැඟීම් පරීක්ෂා කළ යුත්තේ ඔවුන්ගේ බාහිර ස්වරූපය හෝ ඔවුන්ට සිය ගමන් මඟෙහි එක් යුගයක් විසින් දෙන ලද හා පැවැත්මට බල කෙරුණු ස්වාභාවය හෝ අද යුගයේදී ඔවුනට පැවතීමට බල කෙරී ඇති ආකෘතියක් මත පමණක් පදනම්ව නොවේ. ඒ සඳහා සාධක රැසක සහභාගිත්වය ලබාගත යුතු වෙයි. මින් එකක් වන්නේ පොදු ඇරඹුම පිළිබඳ ඔවුන් තුළ පවතින සවිඥණික භාවයයි. පොදු ඇරඹුම පිළිබඳ විවාදයන් හා නොඑකඟතාද, එහි ප්‍රති සැකසුම්ද මෙකී සවිඥණික භාවය යටතටම ඇතුලත් කල හැක. මේ අනුව වැදි ජනයා තුළ පවතින පවතින පොදු ඇරඹුම පිළිබඳ ආඛ්‍යානයන් මෙන්ම එකී ආඛ්‍යානයන් පිළිබඳ ඔවුන්ගේ විවේචනයන්ද ඔවුන්ගේ ජනවාර්ගික අනන්‍යතාවයේ සංසක්තිය හා දිශානතිය පිළිබඳ මිනුමක් සම්පාදනය කරයි. මෙම මිනුම වැදි බව අහෝසි වීම / දියව යාම හෝ එකී කාරණා සිදුවීමට ඉතා ආසන්න බවට වන ප්‍රවාදයන් සඳහා නිගමනයක් ලබා දීමට ශක්තිමත් උපකාරකයක් සම්පාදනය කරයි.

**අධ්‍යයන ක්ෂේත්‍රය හා ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය දඹාන, හෙන්නානිගල හා රතුගල යන ආදිවාසී ගම්මාන ඇසුරින් සිදු කෙරුණු අතර දත්ත රාශිකරණය සඳහා සහභාගිත්ව නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡාවන් හා ප්‍රශ්නාවලීන් මූලික වශයෙන් යොදා ගැනිණි. අධ්‍යයනයට ප්‍රස්තුත කාරණය අරඹයා මූලික දැණුවත්කමකට ගමන් කිරීම විෂය ක්ෂේත්‍රය ඔස්සේ ලියවුණු සාහිත්‍ය විමර්ෂණය ඔස්සේ සිදුකර ඇත.

**අනන්‍යතාව හා ප්‍රතිරෝධී අනන්‍යතාව**

අනන්‍යතාවයේ ආකාර ත්‍රිත්වයක් කාස්ටල්ස් (1988) ගෙන් උපුටා දක්වමින් හා තමන්ගේද එකතු කිරීම් සමඟ Langman (2011) විසින් ඉදිරිපත් කරයි.

1. සුජාතකරණිත අනන්‍යතාව (legitimating identity)
2. ප්‍රතිරෝධී / ප්‍රතිරෝධක අනන්‍යතාව (resistance identity)
3. ප්‍රක්ෂේප අනන්‍යතාව (project identity)

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License..

කාස්ටල්ස් ට අනුව සුජාතකරණීත අනන්‍යතාව පවත්නා තත්වයේ (status quo) තිරසාරත්වය සමඟ බැඳී පවතී. බොහෝ මිනිසුන් ගතානුගතික වන අතර ඔවුන් සාමාන්‍යයෙන් අධිපති ධර්මතාවන්, අගයන්, අභ්‍යාසයන් ^practices& හා අනන්‍යතාවන් ප්‍රතිනිෂ්පාදනය කරයි. ඒ තුළ පංතිමය, කුලමය, ආගමික සබඳතා ආදිය ඇතුලත් පවතින බල ව්‍යුහය තිරසාරවේ. ප්‍රතිරෝධක අනන්‍යතාව විවිධ උප සංස්කෘතීන් රැසක දැකගත හැක. එම තත්ත්වය ඔවුන් පිළිඹිමු කරනුයේ සම්මත රාමුවට පිටතින් පිහිටවූ සංගීතය, ඇඟළුම් විලාසිතා හා ජීවන විලාසිතාවන් ආදී දෑ ඔස්සේය. කෙසේ වෙතත් බොහෝ විට මෙම අනන්‍යතාවන් මහ සමාජයේම එක් කොටසක් ලෙස හැඳින ගත හැක. පුද්ගලයාට විකල්ප ජීවන ප්‍රදේශයක් මෙම අනන්‍යතා ඔස්සේ විවර වනු ලබයි. එසේම සමහර විටෙක මහ සමාජයෙන් පරාරෝපනයට හා නිර්මානුෂීය සැලකුම් ලබන පුද්ගලයන්ට යම් ඉඩකඩක්ද මෙම සංස්කෘතීන් විසින් විවර කර දෙනු ලබයි. වැදි ජනයා ගතහොත් ඔවුන් "ශිෂ්ඨාචාරගත" සිංහල අසල්වැසියන් සමඟ දිගු කලක් දිවිගෙවා ඇත. සමහර අවස්ථාවලදී වැදි බව හා සිංහල බව ජනවාර්ගික රේඛා ඔස්සේ බෙදුම් කඩන යෙදීමද අපහසු කාරණයක් බවට පත්වේ. එහෙත් ඔවුන් තුළ ඔවුන්ට අනන්‍ය වූ සම්ප්‍රදායන් රැසක් හැඳින ගත හැකි විය. සිය සම්ප්‍රදායන්ගෙන් වෙන් වීම ඔස්සේ ඔවුන්ගෙන් වැඩි කොටසක් සිංහල අනන්‍යතාව දෙසට සංක්‍රමණය වූ බව පර්යේෂකයින් සනාථ කොට ඇත. එහෙත් තවත් කොටසක් අදටත් සිය සම්ප්‍රදාය තුළ දිවි ගෙවීම විශේෂ සංසිද්ධියකි. මේ තුළද ප්‍රතිරෝධී අනන්‍යතා ගතිලක්ෂණ දැකගත හැක. ප්‍රක්ෂේප අනන්‍යතාව ප්‍රතිරෝධ අනන්‍යතාවට වඩා ගැඹුරට ගමන් කරන්නක් වේ. බොහෝ විට ප්‍රතිරෝධ අනන්‍යතාවන් විසින් ප්‍රතිනිර්වචනයන් ඔස්සේ ප්‍රක්ෂේප අනන්‍යතා ගොඩ නැංවනු දැකගත හැක. උදහරණ ලෙස සමාජයේ ආන්තික කොටස් ලෙස දැකිය හැකි සමලිංගික කණ්ඩායම් සිය හඬ නගමින්ද, සංවිධානය වෙමින්ද ගොඩනගනුයේ ප්‍රක්ෂේප අනන්‍යතාවන් වේ. මේ මත මහ සමාජයීය සැකැස්මේ විපරිවර්තනයක් අත්දැකිය හැක. එසේම කාන්තා අයිතීන් පිළිබඳ කතිකාව හා ස්ත්‍රීවාදී ව්‍යාපාරයන්ද නව අනන්‍යතා සාධනය හෙවත් ප්‍රක්ෂේපිත අනන්‍යතා නිර්මාණය කරයි. කාස්ටල්ස් සඳහන් කරන්නේ සුජාතකරණීත අනන්‍යතාව ග්‍රාම්ස්චියානු හෙජමනික න්‍යායයන් සමඟ බද්ධ වන බවයි. මේ අනුව සුජාතකරණීත අනන්‍යතාව පිළිබඳ සංකල්පය තුළ බලය හිමි පන්තියේ (හා අධිපති ජනවාර්ගික කණ්ඩායමේ / කණ්ඩායම්වල) පැවැත්ම තහවුරු කෙරෙන ලෙස සංස්කෘතිය හා සිතුවිලි හැසිරවීම යන කාරණාද අන්තර්ගතවේ. අධිපති බලය සෙවනෙහි ගොඩනැගෙන "පවතින තත්ත්වය" ස්වාභාවිකකරණයට ලක්වන්නේ "සාමාන්‍ය තත්ත්වය", "පොදු සංවේදිත්වය" හා සියල්ලන්ගේම "හොඳම රුචිය" ලෙසිණි. අධිපති මතවාදයන් මිනිසා තුළට අන්තර්ග්‍රහණය කිරීම විවිධ සංස්කෘතික උපාංග හරහා සිදුවේ. ඒවායින් වඩා ප්‍රමුඛ ඒවා ලෙස පොදු අධ්‍යාපනය, ආගම හා මාධ්‍ය සැලකිය හැක. මෙය ඇරඹෙන්නේ ළමුන් සිය පවුල තුළින් "පිළිගත්" ප්‍රතිමාන හා අගයන් අවශෝෂණය කර ගැන්ම ඇරඹීමත් සමඟිණි. මේ අනුව හෙජමනික අනන්‍යතාවන් නිෂ්පාදනය යනු ආධිපත්‍යයේ තිරසාර ආකෘතියක් ගොඩනැංවීමේ ව්‍යාපෘතියකි. ප්‍රවර්තන ලෝකයේ සමාජ ඒකමිතිය තිරසාර කිරීමේ කාර්ය තුළදී අනන්‍යතා ප්‍රදානය කරන ප්‍රධාන මතවාදයන් ත්‍රිත්වය ලෙස Langman (2011) දක්වන්නේ ආගම, ජාතිකවාදය හා පාරිභෝජනවාදයයි. ආගම අතිශය ගතානුගතිකත්වය පිළිබඳ අදහස්ද, වඩා හොද සහ සුභදායී අනාගතයක් පිළිබඳ අදහස් දල්වා තැබීම ඔස්සේද සිය කෘත්‍ය ඉටු කරයි. කාර්මික නූතනත්වයට පරිණාමය වන ලෝකය තුළදී පැවති බූර්ෂුවාව විසින් ජාතිකවාදය පිළිබඳ සංකල්පය ඉස්මතු කරන ලද අතර ආගම රාජ්‍යයෙන් දුරස් කිරීමට බූර්ෂුවාව ක්‍රියාත්මක විය. මේ යටතේ ජාතික රාජ්‍ය සංකල්පය ඉස්මතු විය. ජාතික රාජ්‍ය තුළදී මිනිසා වෙත අන්තර්ග්‍රහණය කෙරුණු හෙජමනික අනන්‍යතා ආකාරයක් ලෙස "පුරවැසියා" යන සංකල්පය හැඳින ගත හැක. පාරිභෝජනවාදය ජනමාධ්‍ය සහයද ලබන සංකල්පයකි. එය මිනිසුන්ගේ පාරිභෝජන චර්යාව මත පාදක සේම එම චර්යාව අධිපති මතවාදය විසින් හසුරුවන්නක්ද වේ. සමහර අනන්‍යතා සන්නම් බවට පත්වී ඇත. වෙළෙඳ දැන්වීම් හරහා මෙම පාරිභෝජන අනන්‍යතා ඉස්මතු කිරීමද, අලෙවි කිරීමද සිදුවේ. ගායන, රංගන හා ක්‍රීඩා තාරකාවන්ද පරිභෝජන අනන්‍යතාවයේ කොටස්කරුවන්ය. මේ අනුව ප්‍රවෘත්ති ඔස්සේ තොරතුරු සැපයීම යන කාරණය පවා තොරතුරු-රසාස්වාදනය (infotainment) යන්න ලෙස වෙනස්ව ඇත (Langman 2011).

ප්‍රතිරෝධ අනන්‍යතාවයේ නව මානයන් සඳහා ගෝලීයකරණ ක්‍රියාදාමය සමීපව බලපා ඇත (Langman 2011). ගෝලීයකරණය පුළුල් සමාජ වෙනස්කම් රැසක් බිහි කළේය. පැරණි ප්‍රජාවන් මැකීගොස් මහා නගර හදිසියේම පෙනී සිටියේය. කුඩා වෙළෙඳ ව්‍යාපාර හා ෆැක්ටරි වැසීගොස් අධිතාක්ෂණික ෆැක්ටරි හා මෝල් සංකීර්ණ පැන නැගිණි. අද දින බොහෝ මිනිසුන්ගේ පැරණි ජීවන මාර්ග ඇහිරී ගොස් ඇත. සාමාන්‍ය ජනයාට සිය අතීතය හා සන්සන්දනාත්මකව වත්මන ගැන සිතා බැලීමේදී පැරණි ජීවිතය වඩා යහපත් බවට හැඟීමක් ඇතිවීම අරුමයක් නොවේ. මේ අනුව සුජාතකරණීත අනන්‍යතාවේ පදනම් ගැටලුවකට මුහුණ දෙයි. සාමාන්‍ය කාලවකවානු වලදී ආගම හා ජාතිකවාදීන් හෙජමනික කෘත්‍යයන් සඳහා සේවයකරන නමුත් සමහර මූලධර්මවාදී ආගම් හා ප්‍රතික්‍රියාකාරී ජාතිකවාදීන් මෙම සුජාතකරණ අනන්‍යතා අර්බුදය හමුවේ ඔවුන් අත්විදි "හොඳම අතීතය" පිළිබඳ මතකයන් ප්‍රතිස්ථාපනය සඳහා යම් ආකාරයක ප්‍රතිරෝධී අනන්‍යතා ආකාරයන් අත්කරගනු දැකගත හැක. මෙතෙක් පැවති අගයන් වෙනස්කම්වලට බඳුන් වන විට සම්ප්‍රදායික ජනයා මෙම තත්ත්වය සංජානනය කරනුයේ අහිතකර තත්ත්වයක් ලෙසයි. ප්‍රධාන සමාජ වෙනස්කම් සිදුවන සමයන් තුළදී අනන්‍යතා ආකාරයන්ගේ මෙම පරිවර්තනයන් දැකගත හැක. මේ අනුව සම්ප්‍රදායික අනන්‍යතා ආකාරයන් නව ලෝකයක් දුටු විට එයට ප්‍රතිරෝධීව ක්‍රියාත්මක වනු දැකගත හැක. මෙම තත්ත්වයන්ට උදහරණ ලෙස මූලධාර්මික ක්‍රිස්තියානි, බෞද්ධ හා ඉස්ලාමිකයන්ගේ ක්‍රියාකලාපයන් පෙන්වා දිය හැක. කෙසේ නමුත් මෙම තත්ත්වයන් කාලයත් සමඟ ප්‍රති සැකැසීම්වලට බඳුන් වෙමින් නැවතත් සුජාතකරණීත අනන්‍යතාවන් නව මානයන්ගෙන් නිර්මාණය වනු දැකගත හැක.

සමාජ ගතිකත්වයන් හා විපරිවර්තනයන් තුළ අනන්‍යතාවන් පරිවර්තනයන්ට ලක්වේ. විසිවන සියවස තුළ සමාජ ව්‍යාපාරයන් මූලිකව අවධානය යොමුකළේ කම්කරු අයිතීන්, ආරක්ෂාව, වෘත්තීය සමිතිගතවීම, වැටුප් හා ප්‍රතිලාභ පිළිබඳවයි. නමුත් අද දින වන විට සමාජ ව්‍යාපාරයන් මේවාට අමතරව වෙනස් ප්‍රපංචයන් දෙසටද අවධානය යොමු කරයි. පැරණි සමාජ ව්‍යාපාර මධ්‍යගත පන්නයේ වන විට ප්‍රවර්තන සමාජ ව්‍යාපාර විමධ්‍යගත, ස්වයංපාලිත හා සහභාගිත්ව ලක්ෂණ දරන ඒවා බවට පරිවර්තිතයි. මෙම පරිවර්තනයට බඳුන් වන ව්‍යාපෘති ඔස්සේ නිර්මානය වන්නේ ප්‍රක්ෂේප අනන්‍යතා වේ. එවැනි සමාජ ව්‍යාපාරයකට උදහරණයක් ලෙස වාර්ෂික ගෝලීය සමාජ සංසදය (Annual Global Social Forum) පෙන්වාදිය හැක. මෙම සංසදය යුද

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License..

විරෝධය, අධිරාජ්‍යවාදය, අසමානතාව, ස්ත්‍රීවාදය, පරිසර සංරක්ෂණය, සම්ප්‍රදායික සංස්කෘතීන් රැකගැනීම වැනි විවිධාකාර වූ සංස්කෘතික / අනන්‍යතා මත අරගල කරයි. මෙහිදී විවිධ නව අනන්‍යතා ව්‍යාපෘතීන් නිර්මාණය වනු මුණ ගැසෙන අතර ඒවා ප්‍රක්ෂේප අනන්‍යතාවන් ලෙස හැඳිනගත හැක. සුජාතකරණිත අනන්‍යතාව දරන ප්‍රජාවන් මෙවැනි ආකාරයේ ප්‍රක්ෂේපිත අනන්‍යතා සඳහා ප්‍රතිරෝධී වේ.

### වැදි බව හා සිංහල බව - අනන්‍යතා රේඛාවන් පිළිබඳ ගැටලු

ජනවාර්ගික කණ්ඩායමක් (ethnic group) ලෙස වැදි ජනයා හැඳින ගත හැකිද යන්න වැදි ජනයා පිළිබඳ අධ්‍යයනයේදී පැන නගින ගැටළුවකි. සෙනෙවිරත්න (Seneviratne 1983) අවධාරණය කරනුයේ වැද්දන් වෙන්වූ අනන්‍යතාවක් සහිත ජන-සංස්කෘතික (ethno-cultural) කණ්ඩායමක්ද යන්න අපගේ ඓතිහාසික, සමාජයීය, සංස්කෘතික මෙන්ම ශාස්ත්‍රාලයීය තලයේ පවා සිත්ගන්නා සුලු ප්‍රශ්නයක් වන බවයි. ඔහුගේ අදහසට අනුව වැද්දන්ට ඔවුන්ගේම ආචාර ධර්ම පද්ධතියක් හා වෙනත් සමාජ, ආර්ථික, හා දේශපාලනික අන්තර් ක්‍රියාවන් සිය වනගත වාසභූමිය තුළ පැවතිණි. එනිසා ඔවුහු අනෙකුත් සියලු ජන-සංස්කෘතික මූලයන් සැලකුවේ "ආගන්තුක" ලෙසිණි (Seneviratne 1983). වැදි ජනයා ප්‍රධාන භාෂා භාවිතාවෙන් වෙනස්වූ භාෂාවක් භාවිතා කරනු ලැබූ / ලබන අතර, ප්‍රධාන ජනවාර්ගික කණ්ඩායම්වලට (මෙහිදී මූලික ලෙස අවධාරණය යොමු කරන්නේ සිංහල ජන වර්ගය කේන්ද්‍රිතව වේ. නැගෙනහිර වෙරළබඩ මුහුදු වැදි ප්‍රජාව සම්බන්ධයෙන් ගන්නා විට මෙම අවධානය දෙමළ ජනවර්ගය දෙසට කේන්ද්‍රිත වනු ඇත) වෙනස් වූ ආඛ්‍යානයන්, අභිචාර, ජීවන විලාසිතාවන් දරා සිටිණු දැකිය හැක. එයට ඔවුන්ගේ ඥාතීත්ව රටාව මෙන්ම ආගමික දිශානතියද අයත්ය. අනෙක් අතට ඔවුන් සිංහල කුල ධූරාවලියෙන් පිටත ස්ථාපිතව පැවතීම (Brow 1978) වැදි ජනයා පිළිබඳ වෙනම ජනවාර්ගික අනන්‍යතාවක් ඇතුලත්කර හැඳින ගැනීමට රුකුල් දෙයි. එහෙත් බ්‍රාව් ම (Brow 1978) මෙම අනන්‍යතා ගැටලුව පිළිබඳව සාකච්ඡා කරමින් සටහන් කරන්නේ ඔහු විසින් විමර්ශණය කරන ලද රචනාවන් ඔස්සේ මේ පිළිබඳව පැහැදිලි නිගමනයකට ඒම අපහසු බවයි. විවිධ පර්යේෂකයන් මෙම කාරණය පිළිබඳ පොදු එකඟතාවකට පැමිණ තිබෙණු දැකගත නොහැක. සමහර පර්යේෂකයන් වැදි ජනයා සිංහල ජනවාර්ගිකත්වය තුළ ස්ථාපිත කර හැඳින ගැනීමට ආසක්ත වන විට තවත් සමහර පර්යේෂකයින් ඒ පිළිබඳව කිසිසේත් එකඟ නොවෙති. කෙසේ වෙතත් මෙම කාරණය මෙකී පත්‍රිකාවේද කේන්ද්‍රීය කාරණයක් වන නිසා මෙය වඩා පුළුල්ව අවධාරණයට ගත යුතු වනු ඇත. මන්ද වැදි ජනයා හා සිංහල ජනවාර්ගිකත්වය ඉතා දැඩිලෙස අන්තර් සබැඳියාවන් සහිත, පොදු ලක්ෂණ රැසක් අන්තර්ගත මෙන්ම ඔවුන්ගෙන් බොහෝ කොටසක් දුරාතීයේදීම සිංහලකරණයට ලක්වූ බවට (මෙන්ම සිංහලයන් වැද්දන් බවට පත්වූ බවටද) සාධක පවතින හෙයිනි (ඔබේසේකර 2007). තවත් උදාහරණයන් ගතහොත් අති දක්ෂ දඩයක්කරුවන් වූ වැදි ජනයා රාජකීය ගෘහයන්ට මස් සැපයූ අතර (Wijesekera 1982: 13), සිංහල රජුගේ හමුදුව නියෝජනය කළේය, සිංහලුන් සමඟ අවාහ විවාහයන්ට පත්විය.

වෙනම භාෂාවක් මත ජනවාර්ගිකත්වය පිළිඹිමු වන මිනිස් සමූහයන් සමාජ වාග්විද්‍යාත්මක ජනවාර්ගික කණ්ඩායම් (socio-linguistic ethnic group) ලෙස හැඳින ගත හැක. මුලර් (Müller 2008) අප්‍රිකානු එකාන්වරු (*Akan*) හැඳිනගන්නේ මේ ආකාරයෙනි. මේ ලෙස වැදි ජනයා සමාජ වාග්විද්‍යාත්මක ජනවාර්ගික කණ්ඩායමක් ලෙස හැඳින්වීමට හැකිද යන්න නූතනයේ ගැටළුවක් ලෙස පැන නගිණු ඇත්තේ වැදි ජනයා සිය භාෂාව වෙනුවට වඩ වඩා සිංහල බස දෙසට සංක්‍රමණය වී ඇති හෙයිණි. අද වන විට ඔවුන් අතරින් සමහරෙකුට සිංහල බස කියවීමේ හා ලිවීමේ හැකියාවද ඇත ( Wijesekera 1982: 04). නූතන ලෝකය හා ගනුදෙනු කිරීමට කාලයන් හා අංක ඉදිරිපත් කිරීමට වචන පවා රහිත (Wijesekera 1982: 04) මෙම අවවර්ධිත භාෂාව ප්‍රමාණවත් නොවීම හා බාහිර ලෝකය සමඟ ගනුදෙනු කිරීම පහසුකර ගැනීම වැදි ජනයා සිංහල බසට සංක්‍රමණය වීමට ප්‍රධාන හේතූන් වන්නට ඇත. මේ අනුව නූතනයේ දී වැදි බස ඔවුන්ගේ අනන්‍යතාව පිළිබඳ ඓතිහාසික අගයකින් හෙබි හා සංදර්ශනාත්මක අගයකින් හෙබි ප්‍රපංචයක් ලෙස මිස එය ජනවාර්ගිකත්වයේ ස්වාභාවය විස්තර කිරීමට පුළුල් ලෙස යොදගත හැකි ප්‍රපංචයක් නොවේ. අනෙක් අතට සමහර පර්යේෂකයන් හා රචකයන් වැදිබස හඳුනාගන්නේ "කැඩුණු" සිංහලයක් ^—*broken*˜ *Sinhalese*& ලෙස මිස වෙනම භාෂාවක් ලෙසින් ද නොවේ. භාෂා විශේෂඥයින්ගේ අදහසට අනුව[1] වැදි බසේ ව්‍යුහාත්මක හා ව්‍යාකරණ පසුබිම සිංහලට සමාන වේ (Wijesekera 1982: 04). එහි වාක් කෝෂය තුළ සිංහල වදන් අන්තර්ගත අතර වසර 2500 කට අධික කාලයක සිට සිංහලයන් සමඟ සබඳතා පැවතීම මත එසේ සිදුවීම ස්වාභාවිකවේ (Wijesekera 1982: 04). මේ අනුව ජනවාර්ගික හැඩතල වැදි ජනයා තුළ හඳුනා ගැනීමේදී මෙම භාෂාව හා සිංහල බස වෙනම අනන්‍යතා සහිතද යන්න ගැටලුවක් ලෙස පැන නැංවේ. කෙසේ වෙතත් අමතක නොකළ යුතු කාරණය වන්නේ ජනවාර්ගික අනන්‍යතාව සම්බන්ධයෙන් ගත්විට භාෂාව එක් නිර්නායකයක් පමණක් වන බවයි. එහෙත් එය බොහෝ විට ප්‍රමුඛ නිර්නායකයක් ලෙස පෙනී සිටිනුද දැකගත හැක.

ඉහත කාරණා සියල්ල සලකා බැලූ කල වැදි ජනයා සමාජ සමූහයක ලක්ෂණයන්ට එහා ගිය නිර්නායකයන්ට යටත් කරගතහැකි ජනකොටසක් බවට ඉඟි පළවේ. ඔවුන් සමාජයීය පර්යන්තයක් නියෝජනය කරන නමුත් එම පර්යන්තය සාමාන්‍ය උප සංස්කෘතික අනන්‍යතා තුළ තබා හැඳින ගැනීමද අපහසුය. මන්ද ඔවුන් (වැදි ජනයා) තුළ සිය ආරම්භය පිළිබඳ ආඛ්‍යානයන්, සිය සමූහය පිළිබඳ සවිඥාණකත්වය, සමූහය තුළ දිවිගෙවීම හා සමූහයේ නීති රීතිවලට අවනතවීම දක්නට ලැබෙන අතර ඔවුන් සිය සම්ප්‍රදායික නායකත්වය පවත්වාගෙන යාම කැපී පෙනෙන තත්ත්වයකි. සම්ප්‍රදායික නායකත්වය ජනවාර්ගික සමූහයක් ලෙස වැදි ජනයා හැඳින ගැනීමට මේ අනුව තවත් පැහැදිලි දර්ශකයක් වේ. එහෙත් නැවත වරක් සිතා බලනොත් වැදි ජනයාගේ පොදු ඇරඹුම පිළිබඳ ආඛ්‍යානයන් ඔවුන්ටම විශිෂ්ට වූවක්ද යන්නද ගැටලු සහිතය. විජය හා කුවේණියගේ දරුවන් දෙදෙනාගෙන් වැදි ජනයා පැවතෙයි යන ආඛ්‍යානය මහා වංශය පෙළ තුල අන්තර්ගත වූවකි. නැවත වටයකින් සලකා බැලූ විට සිංහල ජනයා හා වැදි ජනයා පොදු ඇරඹුම පිළිබඳ පොදු ආඛ්‍යානයක් බෙද හද ගනු ඇත යන්න තුළ ඔවුන් සිංහල ජනවර්ගයෙන් විභේදනය කර දැක්වීම ගැටලුකාරී බවටද මත පළවෙයි. එහෙත් මෙහිදී අත්දැකිය හැක්කේ මෙම ආඛ්‍යානය "ශිෂ්ටාචාරගතවූ" සිංහල අධිපති ඇස ඔස්සේ (මහාවංශය) නිපදවූවක් මිස එය වැදි ජනයා අතර

1 විජේසේකර මෙයින් අදහස් කරන්නේ W.Geiger හා ඔහු විසින් "The Grammar of the Sinhalese Language" කෘතියෙන් ඉදිරිපත් කරන අදහස්ය.

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License..

පැවති ආඛ්‍යානයක්ද යන්න එම මත පළකරන්නන් දක්වා නොමැති වීමයි. ඒ කෙසේ වෙතත් අද දින වැදි ජනයා සිය ඇරඹුම පිළිබඳව පවසන විජය-කුවේණී ආඛ්‍යානය මහා වංශ ආඛ්‍යානය සමඟ සමපාත වේ.

## දත්ත විශ්ලේෂනය හා සාකච්ඡාව

දඹාන ප්‍රදේශයට අදළව විජය-කුවේණී ආඛ්‍යානය පිළිබඳ දැනුම්වත් ප්‍රතිශතය අංක 01 වගුව ඔස්සේ නිරූපනය කර ඇත. මේ තුළ පොදු සම්භවය පිළිබඳ විජය-කුවේණී ආඛ්‍යානය පිළිබඳව පමණක් දැනුම්වත් පිරිස මෙන්ම එම ආඛ්‍යානය ප්‍රශ්න කරනු ලබන පිරිසද ඇතුලත්කර ඇත. ස්ත්‍රී පුරුෂ භාවය මත හා වයස් සීමාවන් මත ද මෙම දැනුම්වත් බව පිළිබඳ වෙනස්කම් පැන නැංවී ඇති බව නිරීක්ෂණය කළ හැක. තරුණ පරපුර වැඩිහිටි පරපුරට සාපේක්ෂව ආඛ්‍යානය පිළිබඳ දැනුම්වත්වීම සුවිශේෂී තත්ත්වයකි. එහෙත් මෙම පත්‍රිකාවේ මූලික අරමුණ සමඟ එකී කාරනාවන් ගමන් නොකරන හෙයින් ඒ පිළිබඳව විශ්ලේශනයන්ට ගමන් කිරීමට අදහස් නොකරමු. විජය-කුවේණී පුරාවෘත්තය තුළින් දැක්වෙන ඉතිහාසයට වඩා ගැඹුරට සිය ඉතිහාසය විහිදෙන බවට තර්ක නැගීම විශේෂිත අවස්ථාවක් වන අතර මෙසේ විජය කුවේණී පුරාවෘත්තය පිළිබඳ සැකපහළ කළ ප්‍රමාණය ආඛ්‍යානය පිළිබඳ දැනුම්වත් සමස්ත පිරිස අතරින් ප්‍රතිශතයක් ලෙස 30% කි. හෙන්නාතිගල හා රතුගල ප්‍රදේශවලට අදලව පොදු සම්භවය පිළිබඳ දැනුම්වත්කම හා එයට ප්‍රතිරෝධී දහස් දැක්වීම් පිළිබඳ තත්ත්වය දඹාන ප්‍රදේශයට සාපේක්ෂව යම් විචලනයත් දරන නමුත් ප්‍රමාණාත්මකව ප්‍රශස්ථ අගයක් හෙන්නාතිගල ප්‍රදේශය සම්බන්ධයෙන්ද ඉදිරිපත් විය.

| | ආඛ්‍යානය පිළිබඳ දැනුම්වත් (%) | | ආඛ්‍යානය පිළිබඳ නොදැනුම්වත් (%) | |
|---|---|---|---|---|
| | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ |
| අවු 18-39 අතර | 70 | 85 | 30 | 15 |
| අවුරුදු 40 හා වැඩි | 55 | 75 | 45 | 25 |

අංක 01 වගුව: විජය කුවේණී පොදු සම්භවය පිළිබඳ ආඛ්‍යානය පිළිබඳ දැනුම්වත්කම - දඹාන

"ලංකාවේ ගෝත්‍ර තුනක් තිබිල තියෙනවා. ආදිවාසීන් යක්ෂ ගෝත්‍රිකයින්ගෙන් පැවතිලා තියෙනවා. අවුරුදු 37000 ක් විතර පැරණියි. අදත් අපි ඒ නිසා මලගිය ඇත්තො අදහනවා. කන්ද යකා ආදීන් අදහනවා."
(තලාවරිගේ ගුණරත්න -අවු: 24 – දඹාන)

"අපි පැවතෙන්නේ යක්ෂ, දේව, නාග ගෝත්‍ර තුනෙන් එකක් වන යක්ෂ ගෝත්‍රිකයන්ගෙන්. එහෙම නැතිව විජය රජුගෙ ළමයි දෙන්නගෙන් නෙවෙයි"
ඌරුවරිගේ රංජිත් - අවු 35 – දඹාන)

"මම අහල තියෙන්නෙ නම් විජය රජ්ජුරුවොන්ගේ කුවේණියගේ පරම්පරාව කියල තමයි. ඊටත් ඉහතට තියෙනව කියල විශ්වාස කරනවා"
(ඌරුවරිගේ ජයසුන්දර - අවු: 34 – දඹාන)

අපේ පරම්පරාවේ පැවතීම අවුරුදු 35000 කටත් ඉහළින්. බුදු හාමුදුරුවෝ බුදුවෙලා මාස නවයකට පස්සෙ මහියංගනේට වැඩියා. ඒ වනවිටත් හිටියා කුවේණිගේ පරම්පරාව. කුවේණිය අපේ සාමාජිකාවක් මිස එයාගෙන් අපි පැවතුනේ නැහැ."
(තලාවරිගේ පුංචිබණ්ඩා - අවු: 29 - හෙන්නානිගල)

අවුරුදු 30000 කටත් විතර එහා. දැනට ප්‍රබන්ධයේ තියෙන්නෙ විජය-කුවේණි කියල"
(ඌරුවරිගේ ගුණවර්ධන -අවු 56 – හෙන්නානිගල)

"සමහරවිට කියනව විජය රජුගෙන් පැවතුනයි කියල. විජය එන්න කලින් කුවේණී රටේ හිටියා. විජයගෙන් පැවතෙන බවට වන පුරාවෘත්තය මේ වෙන කොට වෙනස් වෙලා. නායක තුමා කියනවා එයට වඩා පැරණි ඉතිහාසයක් අපට තියෙනවා කියලා"
(උනාපානවරිගේ ප්‍රේමරත්න - අවු 37 - දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභා මන්ත්‍රී)

අධ්‍යයනයට ලක්වූ ප්‍රදේශ තුළ දිවි ගෙවන ආදිවාසීන් සමඟ කළ සම්මුඛ සාකච්ඡාවන්ගෙන් කිහිපයක් ඉහතින් උපුටා දැක්වූයේ අප විසින් සාකච්ඡාවට බඳුන් කරන කාරණය පිළිබඳ ඔවුන්ගේ අදහස් ඔවුන්ගේම වචනයෙන් නිරීක්ෂණය කිරීම ද වැදගත් වන හෙයිණි. විශේෂයෙන්ම මෙවැනි කාරණා හුදු සංඛ්‍යා ලේඛණමය දත්ත මතට ඌනනය කර විශ්ලේෂණය කිරීම සාර්ථක ක්‍රමයක් වන්නේ නැත. විජය-කුවේණී පුරාවෘත්තය පිළිනොගන්නා පිරිස් එම ආභාෂය ලබා පැවතියේ වැදි නායකයින් වෙතිනි. වැදි ජන නායකයින් විසින් ප්‍රබල ලෙස මතු කරමින් පවතින අදහසක් ප්‍රජාව වෙත විසරණය වීම ඉහත ආඛ්‍යානයන් තුළින් අත් දැකිය හැක. දඹාන කේන්ද්‍රිතව දිවිගෙවන ආදිවාසී නායකවරයා ප්‍රමුඛත්වය ගෙන ඉදිරිපත් කර ඇති මෙම අදහස හෙන්නානිගල නායකවරයා වන තලාවරිගේ ගුණබණ්ඩියලැත්තෝ පුනරුච්ඡාරණය කරනුයේ "විජය කුවේණියගෙන් පැවතෙන කතාව පිළිගත නොහැකි බවත් බුදුහාමුදුරුවන් හිටපු යුගයේ පවා සිය මුතුන් මිත්තන් වාසය කර ඇති බවත්, අවුරුදු 37000 කට එපිට පරම්පරාවක් තමනට පවතින බවත්ය". රතුගල නායකවරයා වන සුදුවන්නියලැත්තෝ පවසන්නේ "අපේ අම්මල, තාත්තල, ආච්චිල, සීයල අපට කියල තියෙන්නෙ විජය-කුවේණිගෙන් පැවතෙන බව තමයි. ඒත් එයට වඩා ඉතිහාසයක් අපට තියෙනව කියල මම විශ්වාස කරනවා" යනුවෙනි.

හෙන්ද්‍රි පාකර් සිය "*Ancient Ceylon*" (1992) කෘතියේ දක්වන්නේ "සිංහලයන්ගේ පැමිණීමට පෙර සියලුම රට අපගේ විය" යන්න වැද්දන්ගේ ආඩම්බරකාරී ස්ථිරසාර ප්‍රකාශයක් වූයේය යන්නයි. පාකර්ගේ කෘතිය පළමුවරට පළවනුයේ 1909 දීය. ඒ අනුව දහනමවන සියවස අවසානයේ හා විසිවන සියවස හිමිදිරියේදී ද මහාවංශගත විජය-කුවේණී පුරාවෘත්තය (එනම් විජය හා කුවේණියට දාව උපන් දරුවන්ගෙන් වැදි ජනයා පැවතෙන්නේය යන්න) වැදි ජනයා විසින් යම් මට්ටමකින් ප්‍රශ්න කිරීමකට ලක්කර ඇති බව පෙනේ. වර්ථමානයට අදළ විජය-කුවේණී පුරාවෘත්තය පිළිනොගැනීම හෝ ඒ පිළිබඳ සැක පහළ කිරීම තුළ නිශ්චිත ඓතිහාසික අඛණ්ඩතාවක් හඳුනාගත නොහැකි නමුත් විජය රජු පැමිණෙන විටත් කුවේණිය සිටියාය යන තර්කය

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License..

පාකර්ගේ යුගයේදී වැදි ජනයා විසින් ඉදිරිපත් කළ ප්‍රකාශයන්ට සමපාත බවක් දැකගත හැකිවේ. වැදි ජනයා පාකර්ගේ යුගය වන විට එම ප්‍රකාශයන් සිදු කරන්නට ඇත්තේ විජය-කුවේණී වැනි ඓතිහාසික ආඛ්‍යානයන් මතම නැවත පදනම්වය. අද දින වැදි ප්‍රජාව ඉදිරිපත් කරන තර්කනයන් මූලිකව පාදක වන්නේ නූතන පුරා විද්‍යාත්මක සොයා ගැනීම් පාදකවය යන්න පැහැදිලි සත්‍යයකි. ඔවුන්ගේ ප්‍රකාශ තුළට ශිරාන් දැරණියගල වැනි ප්‍රකට පුරා විද්‍යාඥයන්ගේ නම් ඇතුලත්වනු දැකගත හැක්කේ මේ අනුවය. අද දින වන විට පුරා විද්‍යාව හා ආශ්‍රිත ශික්ෂනයන් විසින් අනාවරණය කර ඇති කරුණු පදනම්ව "ඉතිහාසය නැවත ප්‍රතිනිර්මානය" කළ යුතු බවට ශාස්ත්‍රීය කතිකාවන් ගොඩ නැගෙමින් පවතී (සෝමදේව 2011). මෙම ප්‍රතිනිර්මාණය කළ යුතු ඉතිහාසයේ මූලික පදනම සැකසෙන්නේ මහාවංශගත ආඛ්‍යානයන්ගෙන් ගෙන් ඔබ්බට දිවයන ඉතිහාසයක් පැවති බවට වන පුරාවිද්‍යාත්මකව අනාවරණිත "භෞතික" සාධකයන්ය. අද දින අප අතර දිවි ගෙවන වැදි ජනයා අප තේරුම් ගත යුත්තේ "නූගත්" "ප්‍රාථමික" හා "ග්‍රාම්‍ය" අර්ථයන්ගෙන් නොවේ. නූතන වැදි තරුණයා හා මැදි වියේ පසුවන පරම්පරාව පාසල් අධ්‍යාපනය ලැබූ, සාක්ෂරතාව සහිත, ජංගම දුරකතන වැනි අති නවීන සංනිවේදන උපකරණ අත දරන, බටහිර විලාසිතාවන් අනුගමනය කරන පිරිසක් වේ. ඔවුන්ගේ නායකයින් විදේශ සමුළු සඳහා සහභාගි වන අතර සිය ප්‍රජාව මත සැලකිය යුතු සංවිධාන ශක්තියක් හා මතවාදීමය ආධිපත්‍යයක්ද පවත්වාගෙන යයි. වැදි ජනයා පිළිබඳව ප්‍රමාණාත්මක මෙන්ම ගුණානාත්මක වශයෙන්ද විශාල ප්‍රමාණයක් වූ පර්යේෂණ සිදුව ඇත. ඒවා සමාජයීය විද්‍යාවන් හා මානව ශාස්ත්‍රයන්ගේ සිට ස්වාභාවික විද්‍යාවන් දක්වා පරාසයක විහිදී ඇත. විශේෂයෙන්ම පුරාවිද්‍යාවට අදාළ නූතන දැනුම ආදිවාසීන්ගේ ඉපැරණි බවට විද්‍යාත්මක සාක්ෂි සපයමින් සිටී. නායකයින් හා මතවාදීමය ලෙස වඩා සවිඥාණික ප්‍රජාව නූතන ඉතිහාසය හා පුරා විද්‍යාවේ කතිකාවන් හා අනෙකුත් පර්යේෂණාත්මක කාරණා පිළිබඳව දැනුවත්ය. විශේෂයෙන් දඹාන ගත්විට එය වැදි බව පිළිබඳ කේන්ද්‍රයක් ලෙස සංවර්ධිතව ඇත. වැදි නායකවරයාද මූලිකත්වය ගෙන ගොඩ නගා ඇති "ආදිවාසී ජන උරුම කේන්ද්‍රය" අති නූතන මාදිලියේ රාජ්‍ය නොවන සංවිධානයක ආකෘතිය දරයි. එය ආදිවාසීන්ට පැරණි යුගය තුළ "ආගන්තුක" ආකෘතියක් වුවත් අද දින ඔවුන්ගේ සංස්කෘතිය පිළිබඳ මතකයන් සංරක්ෂණයේ හා කෞතුකාගාර ආකෘතියෙන් ප්‍රදර්ශනයේ කාර්ය සිදුකරයි. ඒ තුළ දිස්වන්නේ හුදු සංරක්ෂණ කාර්යයකින් ඔබ්බට ගිය "දේශපාලනික" අරමුණකි. වැදි බව සංරක්ෂණය වැදි නායකයින් උදෙසා සිය පැවැත්මේ අත්‍යාවශ්‍ය අංගයක් බවට නිතැතින් පත්වේ. ලංකාව ගත්විට අනන්‍යතා සාධකය මත ඉතා දිගු කලක් ප්‍රධාන ජනවාර්ගික කණ්ඩායම් ද්විත්වය සිවිල් යුද්ධයක නියැලුණු රාජ්‍යයකි. මේ නිසා, ලංකාව තුළ භූමියේ හිමිකාරිත්වය පිළිබඳ කතිකාව ඉතා ප්‍රමුඛ කාරණයක් බවට පත්වී ඇත. භූමියේ හිමිකාරිත්වය හා ඉපැරණි බව යන කාරණා මත තම තමනට වාසිදායක කාරණා උළුප්පා දක්වමින් සිදුවන සාකච්ඡාවන් හා ප්‍රචණ්ඩත්වයට බර විවාදයන් නිතර අත්දැකිය හැක. නමුත් මෙම "සාකච්ඡාවන්" වෙත වඩා හොඳ හේතු සාධක සහිතව ප්‍රවේශ විය හැක්කේ වැදි ජනයා වෙතය. මෙම අවස්ථාවෙන් ප්‍රයෝජනයට ගැනීම වැදි නායකයින් විසින් සිදුකළ අවස්ථාවක් ලෙස විජය කුවේණී පුරාවෘත්තය වෙනුවට වඩා පැරණි ඉතිහාසයකට හිමිකම් කීම අර්ථ දැක්විය හැක. මහාවංශය අධිපති ඇසක් තුළින් උත්පාදිතයි. එය සත්‍ය ඉතිහාසය හා ප්‍රබන්ධය යන කාරණා මිශ්‍රිත ලියවිල්ලකි (මල්ලිකාරච්චි 2011). මහාවංශය වැදි ජනයා ස්ථාපිත කරනුයේ "සිංහල" බවට පහතිනි. සිංහල අධිපතිවාදී ඇස තුළ සිය සම්භවය යම් අඩු තලයක ස්ථානගත වන ලෙස ආඛ්‍යාන ගත කිරීම වෙත ප්‍රතිරෝධී වීමක්ද වැදි ජනයා මහාවංශ ආඛ්‍යානය ප්‍රතික්ෂේප කිරීම / සැකකිරීම තුළ නියෝජනය වේ. මෙම කාරණා ද්විත්වයම "ආදිවාසී දේශපාලනයක" හැඩ හුරුවක් ජනිත කරන බව පැහැදිලි වන්නේ මතවාදයේ නිර්මාපකයන් හා ප්‍රචලිත කරන්නන් වන්නේ ආදිවාසී නායකයින් වීම ඔස්සේය.

ශාස්ත්‍රීය තලයේදී හැර සිංහල සමාජය සිය පොදු ඇරඹුම පිළිබඳ විජයාවතරණ පුරාවෘත්තය ප්‍රති අර්ථකතනයකට ගමන් කිරීමක් අත් දැකිය නොහැකි නමුත් වැදි ජනයා සිය පොදු ඇරඹුම පිළිබඳ අඛ්‍යානයන් ප්‍රති අර්ථකතනය කරන්නේ ඇයිද යන්න ගැටලුවක් ලෙස හමුවේ. විවිධ රාජ්‍ය ආයතන, අධිකාරීන් හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ වැදි නායකයින් ගනුදෙනු කරයි. ඔවුන් එහිදී පෙනී සිටිනුයේ වැදි ප්‍රජාවේ භාරකරුවන් ලෙසිනි. මෙම අන්තර්ක්‍රියාවන් තුළදී ඔවුන් වෙත එක්තැන්වන බලය හා ආධිපත්‍ය පැරණි පන්නයේ ගෝත්‍රික අකෘතියේ බලය හා ආධිපත්‍යම ලෙස හඳුනා ගත නොහැක. එම නායකත්ව බලය හා ආධිපත්‍ය, නූතනයේදී සාම්ප්‍රදායික ආකෘතියෙන් ඔබ්බට ගොස් විධිමත් බවට පත්වනු නිරීක්ෂණය කළ හැක. වැදි නායකවරයාට (හා ප්‍රාදේශීය නායකයින්ට ඊට අඩුතර මට්ටමින්) දේශපාලන අධිකාරියේ ඉහළ පුද්ගලයින් සමඟ සෘජු සබඳතා පවතී. සමාජයීය ක්ෂේත්‍රයේදී ප්‍රභූත්වය නියෝජනය නොකරන කොටසකට මෙවැනි ඉහළ ප්‍රභූන් හා සබඳතා ඇති කර ගැන්ම අපහසුය. වැදි නායකයන්ය යන සංකේතීය වටිනාකම මත ඔවුන්ට මෙම සමාජ තත්ත්වය හිමිව ඇත. මේ තුළ ඔවුන් තමුන් විජයට හා කුවේණියට දාව උපන් දරු දෙදෙනාගෙන් පැවතෙන බව කියන මහාවංශ ආඛ්‍යානය බැහැර කරන්නේ ඇයි? සිංහලයන් සමඟ, විශේෂයෙන් සිංහල ප්‍රභූත්වය සමඟ තම පරපුරට ඇති "කිට්ටු සබඳතාවය" නිරූපණය කෙරෙන මහා වංශ ආඛ්‍යානය ප්‍රති ආඛ්‍යානගත කරන්නේ ඇයි?

මෙම තත්වය විස්තර කළ හැක්කේ පසුගිය දශක කිහිපය තුළ ලංකාව මුහුණදෙන දේශපාලනික වට පිටාව ඔස්සේය. සිංහල හා දෙමළ ජනවාර්ගික කණ්ඩායම් අතර ප්‍රතිඝතික ව දැවෙන ජනවාර්ගික අර්බුදයේ පාදම වන්නේ නිජබිම පිළිබඳ සංකල්පයයි. ඉහත දක්වා ඇති වැදි බව වඩා ශක්තිමත් තලයකට ගෙන යාමට නිජබිම පිළිබඳ සංකල්පය ඉස්මතු වීම වැදගත් වේ. මෙම සංකල්පය ප්‍රජාව තුළ විසරණය වීම හරහා ප්‍රජාවේ සංසක්තිය වර්ධනයටද, විශේෂයෙන් පොදු ඇරඹුම පිළිබඳ අධිපති ඇස විසින් සම්පාදිත ප්‍රවාදයන් වෙනුවට ස්වාධීන ප්‍රවාදයන් නිර්මාණය වීම හරහා ප්‍රජාවේ අභිමානය හා ඒකාබද්ධතාවය ශක්තිමත් වීමද වැදි නායකයින් බලාපොරොත්තු වන්නට ඇත. මේ අනුව අපට පෙනී යන කාරණයක් වන්නේ විජය-කුවේණී පුරාවෘත්තය බැහැර කිරීම ඔස්සේ වැදි නායකයින් සියුම් ලෙස දේශපාලන ප්‍රවේශයකින් අධිපති ජනවර්ග වෙත ප්‍රතිරෝධී ප්‍රවේශයක් මෙන්ම ඔවුන්ගේ ප්‍රභූන් සමඟ පවත්වන ඉහළ මට්ටමේ සබඳතා ඔස්සේ ඒකාබද්ධතාවයක්ද ලෙස ප්‍රතිඝතික සබඳතාවක් පවත්වාගෙන යන බවයි.

විශේෂයෙන්ම එය අධිපති මහාවංශ ආඛ්‍යානයන් ඔස්සේ තමුන් ස්ථරායනමය නොවූවත් ප්‍රභවය මත පහළ ස්ථානයක තැබීම නොඉවසීමකි. එය අනන්‍යතාවයේ හැඩතල නව ආකාරයකින් ප්‍රතිනිශ්පාදනය කිරීමකි. සිංහල සමාජය සමඟ සබඳතාව ප්‍රති නිර්වචනය කිරීමකි. තවත් අතකට

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License..

සිය අනන්‍යතාව වඩා උළුප්පා දැක්වීමේත්, නූතන අර්බුදකාරී කතිකාව තුළ සිය ස්ථානය ස්ථාපිත කිරීමේත් උත්සාහයකි. තවත් අතකට ගතහොත් සිංහල ජනවාර්ගික ප්‍රභූන් සමඟ ආදිවාසීත්වය හරහා වඩා ඉහළ මට්ටමේ ගනුදෙනුවකට යාම වෙනුවෙන් සිදුකරනු ලබන ප්‍රකාශයක් ලෙස ද සැලකිය හැක.

වැදි ජනයාගේ මෙම ප්‍රවාදය පිළිබඳව අධිපති කතිකාව පළකරනුයේ නිශ්ක්‍රීය ප්‍රතිචාරයකි. එය බැඳී තිබෙන්නේ මෙවැනි ප්‍රවාදයන් ඔස්සේ තමනට සිදුවන බලපෑමේ ප්‍රමාණය මතය. ඉතා සීමිත ජනකොටසක් ලෙස වැදි ජනයා සිය පොදු ඇරඹුම වඩා දුරාතීතයට ගෙන යාම සිංහල ආධිපත්‍යයට තර්ජනයක් වන්නේ නැත. වැදි බව හා සිංහල බව ඓතිහාසික සබඳතා ගහන, සමහර අවස්ථාවලදී ජනවාර්ගිකව මිශ්‍ර වෙමින් ගොඩනැගුණු, බොහෝ විට ජනවාර්ගිකත්වය පිළිබඳ පිළිගත් න්‍යායන් ඔස්සේ වෙන් කිරීමට අපහසු සංකීර්ණ අනන්‍යතා ද්විත්වයක් වේ. කෙසේ වුවත් විජය කුවේණී ප්‍රතිආඛ්‍යානය විසින් ගොඩනගන ප්‍රතිරෝධී අනන්‍යතාව ඔස්සේ වැදි ජනයා හා සිංහල ජනයා අතර පරතරය පුළුල් කිරීමට උත්සාහ ගෙන ඇත. එසේම මෙම ආඛ්‍යානය වැඩි වශයෙන් සේවය කරනුයේ ආදිවාසීත්වය පිළිබඳ සංකල්පය වෙතයි. මන්ද අද දින වැදි ජනයා හඳුන්වන "විලාසිතාමය" නාමය ආදිවාසීන් යන්නයි. විජය-කුවේණී ඒකාබද්ධතාවයෙන් සිය බිහිවීම පිළිගැනීම තුළින් ආදිවාසීත්වය පිළිබඳ සංකල්පය ද අර්බුදයට ගමන් කරවයි. ආදිවාසීත්වය යනු ලොව පුරා ක්‍රියාශීලීව කටයුතු කරන සංකල්පයකි. ඒ තුළ අධිපති ජනවාර්ගික බලපෑම් යම් මට්ටමකින් පාලනය කිරීමක්ද, සමාජයීය පර්යන්තය නියෝජනය කෙරෙන සමහර ප්‍රජාවන් වෙත ආරක්ෂාවක් ද පැන නැංවී ඇත. එහෙත් වැදගත් කාරණය වන්නේ ආදිවාසීන් බහුතරය දිගු කලක සිට දැන සිටි ආඛ්‍යානය විජය-කුවේණී පුරාවෘත්තව වීමයි. එයම පෙන්නුම් කරන්නේ වැදි බව මත සිංහල මහා සම්ප්‍රදය දැක්වූ ආධිපත්‍යයේ ප්‍රමාණයයි. එනම් පොදු සම්භවය පිළිබඳ සිය ආඛ්‍යානය වැදි ජනයා වෙත නිර්මාණය කර දී ඇත්තේ සිංහල මහා සම්ප්‍රදය නියෝජනය කරන මහාවංශයයි.

## නිගමන

වැදි ජන නායකයින් හා ඔවුන්ගේ ආභාෂය ලත් කණ්ඩායම් විජය-කුවේණී ආඛ්‍යානය ප්‍රතික්ෂේප කිරීම හෝ සැකයට භාජනය කිරීම මූලික වශයෙන් ප්‍රතිරෝධී අනන්‍යතා ආකෘතියක් පිළිබිඹු කරයි. මෙම කාරණය ඔස්සේ තව දුරටත් පැහැදිලි වන්නේ වැදි ජනයා සිංහල ජනවාර්ගික අනන්‍යතාවයෙන් යම් කිසි පරතරයකින් තවමත් පිහිටන බවයි. විශේෂයෙන් වැදි බව අහෝසිවීම පිළිබඳව පවතින ජනප්‍රිය මතය වෙනුවට අපට ඉඟි සපයනුයේ ජනවාර්ගික හෝ සමාන ලක්ෂණ දරන අනන්‍යතා හැඟීම් වැදි ජනයා තුළ පවතින බවයි. කෙසේ වෙතත් වැදි ජනයාගේ ජනවාර්ගික අනන්‍යතාවයේ ඉදිරි හැඩ ගැසීම් පිළිබඳව ශක්තිමත් පුරෝකතනයක් සිදුකළ හැක්කේ ජනවාර්ගික අනන්‍යතා සඳහා පාදක වන අනෙකුත් සාධකයන් සමඟ ඒකාබද්ධ විශ්ලේෂණයක් ඔස්සේය. එය මෙම පත්‍රිකාවට ප්‍රස්තුත වූ විෂය පරාසයෙන් පිටත පවතින්නක් වන අතර මෙම විශ්ලේෂණය ඒ සඳහා ක්ෂුද්‍ර දායකත්වයක් සම්පාදනය කරනු ඇත.

## සමුද්දේශ

මල්ලිකාරච්චි, ඩෙස්මන්ඩ් (2011, අගෝස්තු 07 - සැප්තැම්බර් 25 ). ඉතිහාසය දෙස විසංයෝජනීයව බලමින් විසංයෝජනය අභිබවායෑමේ අභියෝගය. "රාවය".

ඔබේසේකර, ගණනාත් (2007). වැද්දෝ සියල්ල කොයිබට ගියෝද? ශ්‍රී ලංකාවේ බුද්ධාගම හා ආදිවාසිකත්වය (පරිවර්තනය: අනුරුද්ධිකා කුලරත්න). ශ්‍රී ලාංකේය සමාජය සහ සංස්කෘතිය පාඨනය කිරීම: තෝරාගත් නිබන්ධ, පළමු වෙළුම. සමාජ සංස්කෘතික තීව්‍ර අධ්‍යයනය සඳහා වන කොළඹ ආයතනය.

සෝමදේව, රාජ් (2011, අප්‍රේල් 03). ජාතික ඉතිහාසය නව සුසංවාදයක් දෙසට. "රාවය".

සෝමදේව, රාජ් (2011, ජූලි 21). ඉතිහාසය දෙස විසංයෝජනීයව බැලීම. "රාවය".

Brow, J (1978). Vedda Villages of Anurapura: The Historical Anthropology of a Community in Sri Lanka. London: University of Washington Press.

Langman, L (2011). Identity, Hegemony, and Social Reproduction. *Paper presented at Social Theory Forum, University of Massachusetts, Boston, April 13-15.*

Müller, L. (2008). The reality of spirits? A historiography of the Akan concept of 'mind' . *QUEST: An African Journal of Philosophy / Revue Africaine de Philosophie. XXII: 163-184.*

Seneviratne, S (1983). "The Curse of Kuveni: The Vedda and the Anti-Thesis of Modernization". *Lanka Guardian* - Vol. 6

Wijesekera, N (1982). "Vanishing Veddas". *Journal of Royal Asiatic Society (Sri Lanka),* vol- XXVI.

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License..